# මාළු බබාගේ හොඳම යාළුවා



ටෙනුලි නුවංගී අබේසිංහ

# මාළු බබාගේ හොඳම යාළුවා

වෙනුලි නුවංගී අබේසිංහ

First Edition : 2023

ISBN : 978-624-206-588-5

Written and illustrated by Tenuli Nuwangi Abeysinghe

of Mahamaya Girls' College, Kandy, Sri Lanka

Layout, and the cover page designed by

C. M. Abeysinghe of Mahamaya Girls' College, Kandy, Sri Lanka

Tenuli Nuwangi Abeysinghe ® text copyright ©

Illustration copyright © C. M. Abeysinghe® Layout copyright ©

All rights reserved. No part of this work may be reproduced or utilized in any form or by any means, electronic or mechanical, including photocopying, recording, or by any information storage and retrieval system, without the prior written permission of the author.

hiranya_abeysinghe@yahoo.com

This book was published as an E-book, on 15.11.2023, by Mahamaya Girls' College, Kandy, Sri Lanka.

Catalogue record for this book is available from The National Library and Documentation Services Board, Sri Lanka

**books by Tenuli Nuwangi Abeysinghe**

Babai, babage diga kondei

My Nighmare!



# පිදුම

මගේ අම්මාට,

අප්පච්චීට,

අක්කාට,


අත්තම්මා සහ අත්තාට,

මගේ සියළුම ගුරුමෑණිවරුන්ට හා

ගුරු පියවරුන්ට,


මගේ සියළුම යහළුවන්ට,

ඉතා ආදරයෙන් පිරිනමමි.



# ස්තුතිය

මෙම පොත ලිවීමේ දී සහ චිත්‍ර ඇඳීමේ දී මා වෙනුවෙන්ම කැපවී සිටි මගේ අම්මාට, අප්පච්චීට,අක්කාට මගේ ආදරණීය ස්තුතිය.......



# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


2023 . 11 . 01



මාළු බබා වතුරේ එහාට පීනනවා. මෙහාට පීනනවා.

රවුමට කරනම් ගහනවා.

හොරෙන් හොරෙන් ගිහිල්ලා ගල්මල් පිටි පස්සේ හැංගෙනවා.



හැංගෙන තැනින් ආයෙත් එළියට එනවා.

තව තැනක හැංගිලා හොරෙන් බලාගෙන ඉන්නවා. ආයෙත් හිමීට එළියට එනවා.

ආයෙත් හැංගිලා හොර පැංචෙක් වගේ බලාගෙන ඉන්නවා.



මේ සෙල්ලම දිහා බලාගෙන හිටියා ලොකුම ලොකු රවුම් මාළුවා.

එයා මාළු බබා ළඟට පීනුවා.

"ඔයා මොකද කරන්නේ?, මමත් එන්න ද ඔයාගේ සෙල්ලමට ? "

ලොකු මාළුවා ඇහුවා.




"එන්න එන්න එන්න ! "

"මම මේ හැංගිමුත්තන් සෙල්ලම් කරනවා.....
මම සෙල්ලම් කරන්නේ මගේ හොඳම යාළුවත් එක්ක." මාළු බබා කීවා.

"ඔයාටයි, මටයි දෙන්නටම හොඳට සෙල්ලම් කරන්න පුළුවන්."

"ඉක්මණට ගිහින් අපි දෙන්නම හැංගෙමු" පුංචි මාළු බබා කිව්වා.

ලොකු මාළුවයි, මාළු බබයි දෙන්නම හැංගුණා.



රතු බූවල්ලාටත් සෙල්ලම් කරන්න ආසා හිතුණා.

"මාවත් සෙල්ලමට ගන්නවා ද?" රතු බූවල්ලා ඇහුවා.

"එන්න එන්න අපේ සෙල්ලමට, අපි හැංගිමුත්තන් සෙල්ලම් කරනවා." මාළු බබා කිව්වා.

මාළු බබයි, ලොකු රවුම් මාළුවයි, රතු බූවල්ලයි තුන්දෙනාම හැංගුණා.




මේක දැකලා ජෙලි පැංචාටත් සෙල්ලමට එන්න හිතුණා.

"මාවත් සෙල්ලමට ගන්නවා ද ?" ජෙලි පැංචා ඇහුවා.

"එන්න එන්න, අපේ සෙල්ලමට" මාළු බබා කිව්වා.

"අපි සෙල්ලම් කරන්නේ මාළු බබාගේ හොඳම යාළුවත් එක්ක." රතු බූවල්ලා කිව්වා.



"අපි ඔක්කොම හැංගෙමු. අපේ ආසම සෙල්ලම හැංගිමුත්තන් ....." හැමෝම කිව්වා.

මාළු බබයි, රවුම් ලොකු මාළුවයි, රතු බූවල්ලයි, ජෙලි පැංචයි හතර දෙනාම හැංගුණා.



මුහුදු අශ්ව පැටියා සෙල්ලම දිහා ගොඩාක් වෙලා බලාගෙන හිටියා.

"මාවත් සෙල්ලමට ගන්නවා ද?" මුහුදු අශ්ව පැටියා ඇහුවා.

"එන්න... එන්න... ඔයාත් එන්න" මාළු බබා කිව්වා.

"අපි සෙල්ලම් කරන්නේ මාළු බබාගේ හොඳම යාළුවත් එක්ක" ජෙලි පැංචා කියලා දුන්නා.

හැමෝම තැන් තැන්වල හැංගුණා.




හැමෝම හොරෙන් හොරෙන් එබිකම් කළා.

ආයෙත් වේගයෙන් පීනලා ගිහින් තව තැන්වල හැංගුණා.

කැරකි කැරකි දඟලනවා, ආයේ හැංගෙනවා.


බලන්න බෑ ලස්සනයි......



"කෝ මගේ පුංචි මැණික ?" ලස්සන කටහඬක් ඇසුණා.

හැමෝම කලබල වුණා........

ලොකු රවුම් මාළුවයි, රතු බූවල්ලයි, ජෙලි පැංචයි, මුහුදු අශ්වයයි ඉක්මනට හැංගුණු තැන් වලින් එළියට ආවා.



ලස්සනම ලස්සන මාළු අම්මා හිනා වෙවී බලගෙන ඉන්නවා.

"අද නම් යාළුවො ගොඩාක් අපේ සෙල්ලමට ඇවිල්ලා. ඔක්කමලාම මට අහුවුණා." මාළු අම්මා කිව්වා.

හැමෝම මාළු අම්මා ළඟට පීනුවා.



"කවුද මේ අළුත් යාළුවෝ කට්ටිය?" මාළු අම්මා ආදරෙන් ඇහුවා.

"මම තමයි ලොකු රවුම් මාළුවා"

"මම තමයි රතු  බූවල්ලා"

"මම තමයි ජෙලි පැංචා"

"මම තමයි මුහුදු අශ්ව පැටියා" හැමෝම අම්මා ළඟ දුවටුණා.




"ඒත් කෝ මගේ පුංචි මැණික ?
කොහෙද හැංගුණේ ?"

මාළු අම්මා මාළු බබාට කථා කළා.

මාළු පැංචා කොහේවත් පේන්න නෑ.


"කෝ මේ පුංචි පැංචා.....මට හොයා ගන්න බැරි තැනක හැංගුණා ද? " අම්මා ඇහුවා.



"අපි ඔක්කොම මාළු බබාව හොයමු."

ලොකු රවුම් මාළුවයි, රතු බූවල්ලයි, ජෙලි පැංචයි, මුහුදු අශ්ව පැංචයි, අම්මත් එක්ක එකතු වෙලා මාළු බබාව හෙව්වා.

මාළු බබා හොර පැංචෙක් වගේ ගස් ගොඩක් අස්සේ හැංගී ගෙන බලාගෙන හිටියා.



"කෝ මගේ පුංචි මැණික, කොහෙද හැංගුණේ" මාළු අම්මා, මාළු බබාට කථා කළා.

"එළියට එන්න. එළියට එන්න. මාළු බබා තමයි දිනුම්" යාළුවො ටික කෑගැහුවා.

මාළු බබා හිනා වෙවී අම්මා ළඟට පීනුවා.



"මේ තමයි මගේ හොඳම යාළුවා" මාළු බබා අළුත් යාළුවන්ට එයාගේ අම්මාව පෙන්නුවා.

මාළු අම්මා චූටි මාළු බබාව ආදරයෙන් තුරුළු කරගත්තා.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම  ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින්  රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම  වැනි බහුවිධ පරමාර්ථ ඇතිව  2014 වසරේ දී මා විසින්  අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන  ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා ප්‍රංචි ග්‍රන්ථකතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

ද්විය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට  මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි  ග්‍රන්ථකතු අංකුර ඔබට ලෝකය දිනන ග්‍රන්ථකතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි  පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01



Bar Code: 9 786242 065885